# මම තනියෙන්



**පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර**

2 ශ්‍රේණිය A

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

# මම තනියෙන්




**පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර**

2 ශ්‍රේණිය A

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

කෘතියේ නම : මම තනියෙන්

ප්‍රථම මුද්‍රණය : 2025.01.24

කතාව සහ චිත්‍ර : පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර

කතෘගේ ලිපිනය : අංක: 46/2, පිළවල, ගුන්නෑපාන.

පාසල : මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර.

ශ්‍රේණිය : 2 ශ්‍රේණිය A

ISBN අංකය : ISBN 978-624-208-485-5

පරිගණක අක්ෂර, පිටු සැකසුම

: සංඛ පද්ම බණ්ඩාර

කතෘගේ අනෙකුත් කෘති

- කිටියාට පාඩමක්...
- මම ආසයි ඉගෙනගන්න...
- පාට පාට පාට ලෝකේ...
- Rainbow Fairy
- බඩේ අමාරුව
- මට හරියට වැඩ
- කවුද හොරා?
- අළු කෑදැත්තා නිරීක්ෂණය
- හරි වැඩේ...

# පිදුම

පෙර පාසලේ ගුරුතුමියන්ට

මගේ පාසලේ ඇදුරුතුමියන්ට

මගේ පාසලේ සොහොයුරියන්ට

මගේ අම්මාට, අප්පච්චීට, මල්ලීට, අත්තාට,

සහ

අත්තම්මාට

බැතියෙන් පුදමි.

# හැඳින්වීම

මෙම පොත "හෙරණගත්කරණී 2024" ව්‍යාපෘතිය යටතේ මහාමායා බාලිකා විද්‍යාලයේ 2 ශ්‍රේණිය ඒ පංතියේ පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර ශිෂ්‍යාව විසින් නිර්මාණය කළ කතාවක් හා චිත්‍ර ඇතුළත් පොතකි.

# ස්තූතිය

පොත් ලිවීමට මහඟු අවස්ථාවක් හා පරිසරයක්

තනා දුන්

මගේ පංතිභාර ගුරුතුමිය වන දමයන්ති රත්නායක ගුරු මෑණියන්ටත්,

හෙරණගත්කරණී 2024 ව්‍යාපෘතියේ සම්භන්ධීකාරක තුමිය වන සමන්මලී ගුරු මෑණියන්ටත්,

හෙරණගත්කරණී 2024 ව්‍යාපෘතියේ නිර්මාපක

සෙනවිරත්න මහලේකම්ගේ ගුරු පියාණන්ටත්

ප්‍රාථමික අංශයේ විදුහල්පතිතුමියටත්

අප විද්‍යාලයේ විදුහල්පතිතුමියටත්

ආදරණීය අප්පච්චීටත්, අම්මාටත්, සහ

මල්ලීට

මගේ හද පිරි ස්තූතිය පිරිනමමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිම්පාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

මගේ නම මායා. මගේ අම්මයි, අප්පච්චියි දෙන්න ම වැඩට යනවා. අම්මයි, අප්පච්චියි එන්නේ උදේ ගියාම, ගොඩාක් හවස් වෙලා. අම්මටයි, අප්පච්චිටයි හරිම මහන්සියි, මගෙත් එක්ක සෙල්ලම් කරන්න. ඒ වුණාට දවල්ට මට සෙල්ලම් කරන්න කවුරුවකුත් නෑ.




ඔන්න, නිවාඩු කාලේ එක දවසක, අම්මයි, අප්පච්චියි, දෙන්න ම වැඩට ගියා, මම උදේම අවදි වුණා. එදා ටිකක් වැස්ස. අත්තම්මා කුස්සියේ වැඩ.



ඔන්න, හයියෙන් ම අකුණකුත් පිපුරුවා. මම ටිකක් බය වුණා. මම කාමරේ ජනේලය ළඟ කවුද ඉන්නවා වගේ දැක්කා. ඒ නම්, අපේ නරක කිටී තමා. ගන්න ඕනෑ, ගේ ඇතුලට. මම ජනේලය ඇරියා.






මේ කවද මේ... හරිම කොට කොළ පාට කෙනෙක් එයගේ ඔළුව උඩ කූරු දෙකක් තිබ්බා. හරියට, කූඹියෙක්ගේ වගේ. අය්යෝ ! මායා, මගේ පියාඹන පීරිසියට අකුණක් වැදුනා. ඒක කඩාගෙන වැටුනා.

මෙන්න වැඩක්! එයා මගෙ නමත් දාන්වනේ...

අනේ මන්දා? අම්මා නම් කියල තියෙන්නේ, අඳුනන්නේ නැති අය ගෙට ගන්න එපා කියල. ඒත් මෙයා තෙම්ලනේ...



ඔන්න, එයා ඇතුළට ආවා. එයාගේ නම කීකෝ කියලා තමයි එයා කියන්නේ. මට හරි ම මහන්සියි කියලා එයා කාමරේ පුටුවේ නිදා ගත්තා.



මොනව කරන්නද, මෙයාව දැක්කොත්, අත්තම්මා මට බනී. මෙයාව අපහු යවන්න ඕනෑ. මම, මගේ යාළු සුරංගනාවියට කතා කළා. එයා ප්ලාස්ටික් වුණාට හරිම ලස්සන, හොඳ කෙනෙක්. තමයි එයව ගෙනත් දුන්නේ අප්පච්චි. ඔන්න එතකොටම

සුරංගනාවි මට කතා කලා. "මායා ඔයා හරිම හොඳයි. අපි එයාට උදවු කරමු. ආයෙත්, ගෙදර යන්න". මට හරි පුදුම යි එයා ඇත්ත වෙලා.



සුරංගනාවියි, මමයි, කීකෝ ගාවට ගියා එයාව ඇහැරවන්න. ඔන්න, එතකොට ම ගෙදර විදුලි බලය නැති වුණා. වැස්සයි, තමා ගොඩාක් උදේත් නිසයි, හරිම කරුවල." අය්යෝ.. මම කරුවලට හරිම බයයි. තවත් කවුද අපිට කිව්ව". ඒ කවුද ඒ ?.



අම්මෝ.. භූතයෙක් සුරංගනාවි කෑ ගැහුවා. මමත් බය වුණා. අනිත් කෙනාත්, ඊටත් වඩා හය්යෙන් කෑ ගහුවා.

කීකෝ අවදිවෙලා, එයා අනිත් කෙනාව අල්ලා ගත්තා...

"මොනව උනත් අපි ඔක්කෝම විදුලි බලය එනතුරු එකට ම ඉමු". මම කිව්වා. "ඔයා කවුද?" අපි ඔක්කො ම, අපි ළඟ ඉන්න සුදු පාට ලෝගුව දාපු කෙනාගෙන් ඇහුවා.

"භූතයෙක් නෙද?" අපි ඇහුවා. එයා ඔලුව හෙල්ලුවා.

"ඒත් කරුවලට බයයි" එයා කිව්වා.



බය නැතිවෙන්න අපි ඔක්කෝම සෙල්ලමක් කරමු. අපි කතා වුණා. කීකෝ, එයගේ හෙල්මට් එකේ ලයිට් එක දැම්මා.

අපි හොඳට සෙල්ලම් කළා. අපිට හරිම මහන්සියි. අපිට ටිකක් නින්දත් ගියා. "දෝණී, දෝණී, මායා නැගිටින්න. අද සෙනසුරාදා, අපි එළියට ඇවිදින්න යමු". අම්මා මට කතා කරනවා. අය්යෝ! මම දැකලා තියෙන්නේ හීනයක්නේ.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

9 786242 084855